ජාතික පොලිස් කොමිෂන් සභාව
தேசிய பொலிஸ் ஆணைக்குழு
National Police Commission

අංක 9 ගොඩනැගිල්ල, B.M.I.C.H. පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
9 ஆம் இலக்கக் கட்டிடம், B.M.I.C.H.வளாகம், பௌத்தாலோக மாவத்தை ,கொழும்பு 07.
Block No. 9, B.M.I.C.H. Premises, Bauddhaloka Mawatha, Colombo 07.

මගේ අංකය / எனது இல. / My No. } NPC/Media/PR/01/2025
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2025.03.04

# <u>මාධ්‍ය නිවේදනයයි</u>

01. මෑතකදී ජනමාධ්‍යවල පළවුණු විවිධ ප්‍රවෘත්ති, අදහස් හා එයට ප්‍රධාන වශයෙන් පාදක වූ වැඩ බලන පොලිස්පතිවරයා විසින් 2025.02.22 වන දින මාධ්‍ය හමුවකදී ප්‍රකාශ කළ අදහස් සම්බන්ධව ජාතික පොලිස් කොමිෂන් සභාවේ දැඩි අවධානය යොමු වූ අතර ඒ සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ ස්ථාවරය මහජනතාවට සහ ඒ පිළිබඳව උනන්දුවක් දක්වන වෙනත් පාර්ශවයන්ට පැහැදිලි කරනු වස් පහත සඳහන් මාධ්‍ය නිවේදනය ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබේ.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 උ(1) (ආ) ව්‍යවස්ථාව ප්‍රකාරව පොලිස්පතිවරයා හැර පොලිස් නිලධාරින්ගේ පත්කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීමේ සහ ඔවුන් සේවයෙන් පහ කිරීමේ බලය ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පැවරී ඇති අතර උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, විනය පාලනය කිරීම හා සේවයෙන් පහ කිරීම පිළිබඳ ජාතික පොලිස් කොමිෂන් සභාව සතු බලතල, පොලිස්පතිවරයා විමසා ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේය යනුවෙන් එහි සඳහන් කර ඇත.

03. ඒ අනුව එකී බලතල එනම්, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, විනය පාලනය කිරීම හා සේවයෙන් පහ කිරීම පිළිබඳ ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සෑමවිටම පොලිස්පතිවරයා විමසා සිදුකරනු ලැබේ.

04. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ(1) ව්‍යවස්ථාවට අනුව යම් කාණ්ඩයකට අයත් පොලිස් නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාව සතු බලතල ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි කොන්දේසිවලට සහ කාර්යය පටිපාටිවලට යටත්ව පොලිස්පතිවරයා වෙත හෝ පොලිස්පතිවරයා විමසා යම් පොලිස් නිලධාරියෙකු වෙත ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේය යනුවෙන් සඳහන් කර ඇත.

05. 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ස්වාධීන ජාතික පොලිස් කොමිෂන් සභාව 2022.10.31 වන දින ස්ථාපිත කරනු ලැබුව ද එහි සභාපතිවරයා ඇතුළු සාමාජිකයින් පත් කිරීමෙන් පසු එනම් 2023 මැයි මස 16 දින සිට එහි කටයුතු කිරීම ආරම්භ කරන ලදී.

ක්ෂණික ඇමතුම් / உடன் தொடர்பு / Hot Line : **1960 /0710361010**
දුරකථන අංකය / தொலைபேசி / Telephone } 0112166500
ෆැක්ස් / தொலைநகல் / Fax } 0112166555
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-Mail } info@npc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site } www.npc.gov.lk

Watermarkly

06. 2023 මැයි මස වර්තමාන ජාතික පොලිස් කොමිෂන් සභාව පත්වීමෙන් අනතුරුව, ඉහත සඳහන් කරන ලද ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ(1) ව්‍යවස්ථාවේ සඳහන් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඇතැම් කාර්යය සහ කර්තව්‍ය පැවරීම යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ඊ්ඊ්ඊ් ව්‍යවස්ථාව ප්‍රකාරව 2023.07.20 දිනැති අංක 2341/51 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව පොලිස්පතිවරයාට සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු, නියෝජ්‍ය පොලිස්පතිවරු, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරු සහ පොලිස් අධිකාරීවරු සහ සහකාර පොලිස් අධිකාරීවරු වෙත, පොලිස් කොස්තාපල්වරයාගේ සිට ප්‍රධාන පොලිස් පරික්ෂක (පොලිස් ස්ථානාධිපතිවරුන් /මූලස්ථාන පොලිස් පරික්ෂකවරුන් හැර) දක්වා වූ නිලධාරීන් සම්බන්ධයෙන් ඉහත සඳහන් 155ඒ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව බලතල පවරා දී ඇත.

07. එමෙන්ම මූලස්ථාන පොලිස් පරික්ෂකවරුන්, පොලිස් ස්ථානාධිපතිවරුන් සහ සහකාර පොලිස් අධිකාරි, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි, නියෝජ්‍ය පොලිස්පති සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් සම්බන්ධයෙන් වූ ඉහත කී 155 උ(1)(ආ) ව්‍යවස්ථාවේ සඳහන් බලතල ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත රඳවා තබාගෙන ඇත.

08. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වාදුන් දිනයේ සිට මේ දක්වා පොලිස් නිලධාරින්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් හා විනය පාලනය පොලිස්පති වෙතින් ඉවත් කර, ස්වාධීන ජාතික පොලිස් කොමිෂන් සභාව (දෙවතාවකදී පමණක් එකී බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතද බලය පවරා තිබුණි) වෙතම පැවරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් කටයුතු කර තිබුණි.

09. තවද ශ්‍රී ලංකා පොලිසියේ 80,000 කට අධික වූ නිලධාරීන් සංඛ්‍යාවකින්, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් සහ විනය පාලන කටයුතු සිදු කරනු ලබන්නේ පොලිස් ස්ථානවල මූලස්ථාන පොලිස් පරික්ෂක/ පොලිස් ස්ථානාධිපති තනතුරු හොබවන නිලධාරින් 607 දෙනෙකු සහ රාජ්‍ය නිවේදිත නිලධාරීන් (විශේෂ කාර්ය බළකාය ඇතුළු) 813 දෙනෙකු එනම් නිලධාරින් 1420 ක පමණ වූ ප්‍රමාණයක් සම්බන්ධයෙන් පමණි. ඉතිරි සියළු නිලධාරින්ගෙ පත් කිරීම්, උසස් කිරීම් සහ විනය පාලන බලය ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පොලිස්පති වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිදි විධිමත්ව පවරා ඇත. එසේම එලෙස බලය පවරන ලද නිලධාරීන්ට සහ පොලිස්පතිවරයාට පවත්නා නීති රීති, චක්‍රලේඛ, කාර්යපටිපාටිවල ප්‍රතිපාදනවලට යටත්ව ක්‍රියා කිරීමට පූර්ණ නිදහස ඇති අතර, ඒ සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව කිසිවිටෙකත් මැදිහත් වන්නේ ද නැත.

10. ඉහත සඳහන් ජනමාධ්‍ය වාර්තා මඟින් සහ වැඩ බලන පොලිස්පති විසින්, අවස්ථා ගණනාවකදී ජාතික පොලිස් කොමිෂන් සභාව ඉදිරියේ දක්වන ලද කරුණු සහ ලිඛිතව ඉදිරිපත් කර ඇති කරුණු මඟින් ගම්‍ය වූයේ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන්ගේ ස්ථාන මාරු කිරීම් ආදී කටයුතුවලට සහ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් වෙමින් පොලිස්පතිවරයාගේ කාර්යභාරයට බලපෑම් හා බාධා පමුණුවන බවයි. එනමුත් වැඩ බලන පොලිස්පති විසින් නඟන ලද එකී චෝදනාව ජාතික පොලිස් කොමිෂන් සභාව තරයේ ප්‍රතික්ෂේප කරනු ලබන අතර, වැඩිමනත් වශයෙන් පවසා සිටිනුයේ ජාතික

Watermarkly

පොලිස් කොමිෂන් සභාව සෑමවිටම රටේ ව්‍යවස්ථාපිත නීතියේ ප්‍රතිපාදන සහ අනෙකුත් නීති සහ රීතිවලට අනුකූලව සහ අනුගතව, තමන්ට පැවරී ඇති වගකීම සහ රාජකාරී ඉටු කරනු ලබන බවයි.

11. ජාතික පොලිස් කොමිෂන් සභාවේ සෘජු පාලනයට ගැනෙන නිලධාරීන් සම්බන්ධවද ඉහතින් සඳහන් කරන ලද පත්කිරීම්, උසස් කිරීම්, ස්ථානමාරු කිරීම් සහ විනය පාලනය සම්බන්ධ බලතල ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සියළු අවස්ථාවන්හි දී ක්‍රියාත්මක කර ඇත්තේ පොලිස්පතිවරයාගේ ඉල්ලීම් මත හෝ පොලිස්පතිවරයාගේ නිර්දේශ මත විනා අත්තනෝමතිකව හෝ හුදෙක් ජාතික පොලිස් කොමිෂන් සභාවෙහි වුවමනාවට නොවන බව අවධාරණය කරනු ලබන අතර එවැනි ඉල්ලීම් සලකා බැලීමේදී එම ඉල්ලීම් වල ඇති සාධාරණත්වය, යුක්තිසහගත බව, සේවා අවශ්‍යතාවය, ප්‍රායෝගිකත්වය අදාළ නිලධාරින්ට ඇතිවන බලපෑම් ආදී සියළු කරුණු පිළිබඳව විශ්ලේෂණාත්මකව අධ්‍යනය කොට දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරිමටත් පසුව තීරණවලට එළඹීම ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සෑම විටම සිදු කර ඇත.

12. වර්තමාන ජාතික පොලිස් කොමිෂන් සභාව ස පත්වීමෙන් පසු පොලිස්පති ධූරය හෝ වැඩ බලන පොලිස්පති ධූරය දරණ ලද නිලධාරින් දෙදෙනෙක් සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇති අතර, වර්තමාන වැඩ බලන පොලිස්පති ධූරය දරණ වැඩ බලන පොලිස්පතිවරයා සමඟද කටයුතු කරනු ලබන්නේත් එලෙසමය.

13. වැඩ බලන පොලිස්පති විසින් චෝදනා මුඛයෙන් ප්‍රකාශ කර ඇත්තේ, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් මීට ඉහත පොලිස්පති ධූරය දරණ ලද නිලධාරින් විසින් විටින් විට ඉල්ලා සිටින ලද ස්ථාන මාරුකිරීම් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නොමසුරුව ඉටු කරනු ලැබුවත්, වර්ථමාන වැඩ බලන පොලිස්පතිවරයා විසින් සිදු කරනු ලබන එවැනි ඉල්ලීම් ඉටු කිරිමට ජාතික පොලිස් කොමිෂන් සභාව මැලි වන බවත්ය. එම චෝදනාව පදනම් විරහිත අතර එම චෝදනාව ජාතික පොලිස් කොමිෂන් සභාව තරයේ ප්‍රතික්ෂේප කර සිටී.

14. ඒ සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ ස්ථාවරය වන්නේ වර්තමාන වැඩබලන පොලිස්පතිවරයා පත් වීමෙන් පසු 2024.09.27 වන දින සිට 2025.01.31 වන දින දක්වා නිලධාරීන් ස්ථාන මාරු කිරීම සම්බන්ධව ඉල්ලීම් විවිධ අවස්ථාවන්හි දී සිදුකර ඇති බවත් ඒ ඉල්ලීම් සම්බන්ධව විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කර හා දීර්ඝ වශයෙන් සාකච්ඡා කර ස්ථාන මාරු සඳහා අනුමැති ලබා දී ඇත.

| **නිල නාමය** | **පොලිස්පතිවරයාගේ ඉල්ලීම** | **ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමැතිය** |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 10 | 08 |
| නියෝජ්‍ය පොලිස්පති | 14 | 13 |
| ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි | 60 | 58 |



SRI LANKA MIRROR
Watermarkly

| | | |
|---|---|---|
| පොලිස් අධිකාරි | 13 | 12 |
| සහකාර පොලිස් අධිකාරි | 58 | 56 |
| පොලිස් ස්ථානාධිපති | 239 | 183 |

15. ඉහත පරිදි වැඩ බලන පොලිස්පතිවරයාගේ ඉල්ලීම අනුව කටයුතු කරමින් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ස්ථාන මාරුවීම් වලින් කිහිපයක් වැඩබලන පොලිස්පතිවරයා විසින් අත්තනෝමතිකව කටයුතු කරමින් මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති අතර, ඒ පිළිබඳව වැඩබලන පොලිස්පතිවරයා වෙතින් කරුණු විමසීමටද ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් කටයුතු කර ඇත.

16. වැඩබලන පොලිස්පතිවරයා විසින් ඉල්ලා සිටින ලද එහෙත් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත නොකළ ස්ථාන මාරුවීම් වලට හේතු වූයේ එවැනි ස්ථාන මාරුවීම්වලට අවශ්‍ය කරුණු ප්‍රමාණවත් පරිදි ඉදිරිපත් කර නොතිබීම, එම කරුණු සාධාරණීකරණය කර නොමැතිවීම, පවතින ස්ථාන මාරු පටිපාටියට පත් කිරීමේ ක්‍රමවේදයට හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට අනුකූලව ඉදිරිපත් කර නොමැති වීම, නිර්නාමික පැමිණිලි සහ හෝ බුද්ධි වාර්තා මත පමණක් පදනම් වෙමින් කරන ලද ඉල්ලීම් වන බැවින් ඒවා පදනම් විරහිත බව නිරීක්ෂණය වීම සහ සමහර ස්ථාන මාරු ප්‍රායෝගිකව කළ නොහැකි වීම යන කරුණු මතය.

17. කෙසේ නමුත් ඒ සම්බන්ධයෙන් ද නැවත වැඩ බලන පොලිස්පතිවරයා වෙතින් කරුණු විමසීමට හා අදාළ වාර්තා කැඳවීමට මේ වන විට ජාතික පොලිස් කොමිෂන් සභාව කටයුතු කර ඇත. ඉහත ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබන්නේ නිලධාරින්ට අත්තනෝමතිකව සහ අසාධාරණ ලෙස ස්ථාන මාරු කිරීම් ලබා දුනහොත් එවැනි අවස්ථා අධිකරණයේ අභියෝගයට හා දෝෂ දර්ශනයට ලක්වීම වලක්වා ගැනීමේ චේතනාව සහ එහිදී නිලධාරීන්ට සිදුවිය හැකි අසාධාරණ තත්ත්වයන් වළක්වාලීම නවතාලීම හෝ අවම කර ගැනීම සඳහා පමණක්ම වේ.

18. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බලතල ක්‍රියාත්මක කිරීමේ දී, විශේෂයෙන්ම සැලකිලිමත් වන්නේ පොලිස් සේවයේ ගුණාත්මකභාවය රැකීමටත්, ශ්‍රී ලංකා පොලිසියේ කාර්යක්ෂමතාව උපරිමව පවත්වාගෙන යාමටත් නිලධාරීන්ගේ සුභසාධන හා ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය නොවන ආකාරයට එම බලතල ක්‍රියාත්මක කිරීමට වේ.

19. මෙම වැඩබලන පොලිස්පතිවරයා පත්වීමට පෙර පවා නිලධාරීන් ස්ථාන මාරු කිරීම් සම්බන්ධව පූර්වගාමී පොලිස්පතිවරයා විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සම්බන්ධව, එවකට පැවති වාතාවරණය මත අනුකූල සහ අනනුකූලභාවය සලකා බලා කටයුතු කර ඇති බවත් එහිදී ද යම් යම් ස්ථානමාරු සිදුකිරීම සඳහා අනුමැතිය ලබා නොදීමට කටයුතු කර ඇති බවත් අවධාරණය කරනු ලැබේ. උදාහරණයක් වශයෙන් 2024 ජනාධිපතිවරණය ආසන්න කාල සීමාවේ දී එනම් 2024.07.09 දින මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් /පොලිස් ස්ථානාධිපතිවරුන් 210ක් ස්ථානමාරු කිරීමට එවකට සිටි වැඩබලන පොලිස්පතිවරයා විසින් සිදු කරන ලද ඉල්ලීම ද ජාතික



Watermarkly

පොලිස් කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලදී. එලෙස ප්‍රතික්ෂේප කරනු ලැබුවේ එවකට මැතිවරණයක් ආසන්නව තිබීම සහ පවතින පොලිස් ස්ථානාධිපති තනතුරු වලින් 1/3 කට වැඩි මූලස්ථාන පොලිස් පරීක්ෂක/ පොලිස් ස්ථානාධිපතිවරුන් ප්‍රමාණයක් එකවර ස්ථානමාරු කිරීම යෝග්‍ය නොවන බව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සැළකිල්ලට ගනිමින් බවත් සඳහන් කළ යුතුව ඇත.

20. තවද වැඩ බලන පොලිස්පතිවරයා ජාතික පොලිස් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශයක් කරමින් වර්තමාන ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් කෙටි කාලයක් තුළ (අවස්ථා 05 කදී) තමන් වෙත ස්ථාන මාරු ලබාදීමට කටයුතු කරන ලද බවත්, 05 වන ස්ථාන මාරු අවස්ථාවේදී ඔහු විසින් ඊට දැඩි විරෝධයක් පළකල බවත් එම විරෝධය නොසළකා ඔහු වෙත 05 වන ස්ථාන මාරුවීමද ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ලබාදීමට කටයුතු කර ඇති බව පවසා සිටින ලදී.

21. මේ පිළිබඳව කරුණු සොයා බැලීමේදී වැඩ බලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතාට ලබාදුන්නා යැයි පවසන එකී ස්ථාන මාරුවීම් ලබාදී ඇත්තේ 21වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ස්වාධීන ජාතික පොලිස් කොමිෂන් සභා පිහිටුවීමට පෙර පොලිසිය සම්බන්ධයෙන් කටයුතු කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් බවට කරුණු පැහැදිලි විය.

22. එමෙන්ම ඒ සම්බන්ධයෙන් විරෝධය ප්‍රකාශ කරමින් ජාතික පොලිස් කොමිෂන් සභාවට පිටපත් සහිතව එවකට පොලිස්පතිවරයා වෙත 2024.03.12 වන දින ප්‍රියන්ත වීරසූරිය මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් කරුණු විමසීමේදී 2024.03.04 වන දින ප්‍රියන්ත වීරසූරිය මහතා අපරාධ හා රථ වාහන දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරේ සිට උතුරු මැද පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස ස්ථාන මාරු කිරීමට එවකට වැඩ බලන පොලිස්පතිවරයා විසින් නිර්දේශ කර තිබුණද ඔහු එම තනතුරේ වසරකට අඩු කාලයක් පමණක් සේවය කර ඇති බව ජාතික පොලිස් කොමිෂන් සභාව නිරීක්ෂණය කරමින් එම ස්ථාන මාරුවීම ලබාදීම යුක්තිසහගත නොවන බව සළකා එවකට පොලිස්පතිවරයා ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත කැඳවා ඒ පිළිබඳව විමසා සිටි අතර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතා ප්‍රාදේශීය කොට්ඨාසයකට තමාව ස්ථාන මාරු කරන ලෙස කරන ලද ලිඛිත ඉල්ලීමක් තමන් වෙත කර ඇති බැවින් එම ස්ථාන මාරුවීම නිර්දේශ කළ බව එවකට පොලිස්පතිවරයා විසින් පවසා සිටි අතර ඒ අනුව එකී ස්ථාන මාරුවීම පමණක් මෙම ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සිදුකර ඇත.

23. ඉහත තොරතුරු අනුව ගම්‍ය වන්නේ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත නිලධාරීන් ස්ථාන මාරු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර තිබුණද ඒ පිළිබඳ මැනවින් අධ්‍යයනය කොට ස්ථාන මාරු ලබන නිලධාරීන් ද අපහසුතාවයට පත් නොවන ආකාරයට රාජකාරී අවශ්‍යතාවය සැළකිල්ලට ගෙන ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුකූලවන්නේනම් පමණක් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් එවැනි ස්ථන මාරු කිරීම් අනුමත කිරීමට කටයුතු කර ඇති බවකි.

24. තවද, 2022.05.09 වන දින පැවති අරගලය හේතුවෙන් යම් යම් පොලිස් වසම් තුල සිදුවූ සිද්ධීන් හේතුකොටගෙන අදාල මූලස්ථාන පොලිස් පරික්ෂකවරුන් හා ස්ථානාධිපතිවරුන් තනතුරුවලින් ඉවත් කිරීම හේතුකොටගෙන එම ඉවත් කිරීම අභියෝගයට ලක් කරමින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික


Watermarkly

අයිතිවාසිකම් පෙත්සම් ගොනු කිරීමෙන් අනතුරුව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ එවකට පොලිස්පතිවරයා සහ අදාල නිලධාරීන් එළඹෙන ලද සමථය පරිදි, එම නිලධාරීන් ඔවුන් දරමින් සිටි ශ්‍රේණියට සමාන ශ්‍රේණියක ස්ථානාධිපති තනතුරු ලබාදීමට නියමිතව තිබුණි. එනමුත් පූර්වගාමී පොලිස්පතිවරයා විසින් ස්ථානාධිපතිවරුන් පස්දෙනෙකු සඳහා තනතුරු ලබාදීමට ඉදිරිපත් කර තිබූ නිර්දේශයන් ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ එකඟතාවයන් පිළිබඳව නිසිලෙස සැළකිල්ලට නොගෙන ඔවුන් අපහසුතාවයට පත්වන ආකාරයට දිවයිනේ උතුරු ප්‍රදේශය ආවරණය වන පරිදි එවකට පොලිස්පතිවරයා විසින් නිර්දේශ ඉදිරිපත් කර ඇති බව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදුව, නැවත නිර්දේශ ඉදිරිපත් කරන ලෙසට පොලිස්පතිවරයා වෙත දන්වා සිටීමෙන් අනතුරුව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එකී කරුණු සළකා බලා අපහසුවට පත් නිලධාරීන් වෙත නිසි, පහසු පොලිස් ස්ථානයන් ලබාදෙන ලෙසට නියෝග කරනු ලැබුවේද ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශය ද සැළකිල්ලට ගනිමින් බව සඳහන් කළ යුතුව ඇත.

25.තවද දැනට වැඩ බලන පොලිස්පතිවරයා විසින් පොලිස් ස්ථානාධිපතිවරුන් පත් කිරීම හා ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් නීතිපතිතුමන්ගේ මතය විමසා සිටි බව ප්‍රකාශ කර සිටිය ද, ඒ පිළිබඳව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත මෙතෙක් නිල වශයෙන් කිසිදු දැනුම්දීමක් සිදුකර නොමැත. ඒ අනුව පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ පත් කිරීම, ස්ථාන මාරු කිරීම හා විනය පාලනය ජාතික පොලිස් කොමිෂන් සභාව සතු කාර්යයක් බැවින් වැඩ බලන පොලිස්පතිවරයා විසින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුදැනුමකින් තොරව එසේ නීතිපති විමසීමට කටයුතු කිරීම ද යෝග්‍ය නොවනු ඇත.

26. මීට පෙර ද වැඩ බලන පොලිස්පතිවරයා විසින් පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ ස්ථාන මාරු කිරීම සම්බන්ධව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරා දී ඇති බලතල තමා වෙත පවරා දෙන ලෙස ජාතික පොලිස් කොමිෂන් සභාව වෙතින් ඉල්ලීමක් කරන ලද අතර දීර්ඝ වශයෙන් හේතු දක්වමින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පියවර ගෙන ඇත.

27. වැඩ බලන පොලිස්පතිවරයාගේ ඉහත ඉල්ලීමට අනුව කටයුතු කිරීම තුළින් ඉහත කී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයන් මඟින් ස්වාධීන ජාතික පොලිස් කොමිෂන් සභාවක් ස්ථාපිත කර, මීට ඉහත දී පොලිස්පතිවරයාට තම අභිමතය පරිදි පොලිස් ස්ථානාධිපතිවරුන් ස්ථාන මාරුකිරීමට ලබාදී තිබූ බලතල, සාමාජිකයන් 05කට නොඅඩු 07කට නොවැඩි සාමාජිකයන්ගෙන් සමන්විත ස්වාධීන ජාතික පොලිස් කොමිෂන් සභාවකට පැවරීමේ අභිමතාර්ථය ගිලිහී යන බැවින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු විය.

28. ඉහත සඳහන් ආකාරයට 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ජාතික පොලිස් කොමිෂන් සභාවට හිමි වී ඇති බලතල ප්‍රකාරව කටයුතු කිරීමේ දී කොමිෂන් සභාව විසින් ගනු ලැබූ ඇතැම් තීන්දු, තීරණ ක්‍රියාත්මක නොකිරීම, පිළිබඳව පැන නැඟිය හැකි ව්‍යවස්ථා අර්බුදය සම්බන්ධව 2024.02.21 වන දින වැඩ බලන පොලිස්පතිවරයා වෙත දැනුම් දීමට කටයුතු කර ඇති අතර එය ව්‍යවස්ථාදායක සභාවට දැනුම්දීමටද කටයුතු කර ඇත.


Watermarkly